+9411 2784161
+9411 2784869
moepressroom3@gmail.com



2025-04-24

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025 හේතුවෙන් පාසල් නිවාඩු ලබා දීම

පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ඡන්ද පෙට්ටි සහ අනෙකුත් බඩු බාහිරාදිය ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් වෙත භාරදීම සහ ආපසු භාර ගැනීමේ මධ්‍යස්ථාන හා ප්‍රතිඵල වගුගත කිරීමේ මධ්‍යස්ථාන ලෙස යොදා ගන්නා පාසල් ගොඩනැගිලි, අධ්‍යාපන විද්‍යාපීඨ සහ උසස් තාක්ෂණ ආයතන සම්බන්ධ ව අධ්‍යාපන අමාත්‍යංශ ලේකම් නාලක කලුවැව මහතාගේ අත්සනින් යුතු ව ලිපියක් නිකුත් කර තිබේ.

ඒ අනුව, 2025 මැයි මස 06 වන දින පැවැත්වෙන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ 2025.04.19 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති පරිදි දිවයිනේ සියලු ම පාසල් 2025.05.05 දින නිවාඩු ලබා දෙන අතර, 2025.05.07 දින පාසල් නැවත ආරම්භ කළ යුතු ය.

ඡන්ද මධ්‍යස්ථාන වශයෙන් යොදා ගන්නා පාසල් 2025.05.04 දින අදාළ ග්‍රාම නිලධාරීන් වෙත භාර දීමට කටයුතු කළ යුතු ය. ඡන්ද මධ්‍යස්ථාන කටයුතු සඳහා අවශ්‍ය මේස, ඩෙස්ක්, පුටු සහ ශාලා පහසුකම් ලබා දීමට සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ විදුහල්පතිවරුන් දැනුම්වත් කළ යුතු ය.

ඒ අනුව, මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිගේ ඉල්ලීම මත ඡන්ද පෙට්ටි හා අනෙකුත් බඩු බාහිරාදිය ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත නිකුත් කරන හා ආපසු භාර ගන්නා මධ්‍යස්ථාන ලෙස යොදා ගන්නා ඇමුණුම් 01 හි සඳහන් පාසල් එම ලේඛනයේ සඳහන් පරිදි ඒ ඒ පාසලට අදාළ කාල වකවානුව තුළ පමණක් නිවාඩු ලබා දීමට කටයුතු කරන මෙන් ද පාසල් වේලාවෙන් පසුව ඉල්ලා ඇති පාසල් ඊට අදාළ දිනයේ දී පාසල පැවැත්වීමෙන් පසුව මැතිවරණ කටයුතු සඳහා භාර දිය යුතු බව ද වැඩි දුරටත් එම ලිපිය මඟින් දැනුම් දී තිබේ.

මාධ්‍ය ඒකකය.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2025
පාසල්/ අධ්‍යාපන ආයතන වල ගොඩනැගිලි වෙන් කරවා ගැනීම

| අනු අංකය | දිස්ත්‍රික්කය | පාසලේ නම | කාල සීමාව |
|---|---|---|---|
| 01 | කොළඹ | කොළඹ රාජකීය විද්‍යාලය - කොළඹ -07 | 2025.05.01 සිට 2025.05.07 දක්වා |
| 02 | ගම්පහ | නිට්ටඹුව, ශ්‍රී සංඝබෝධි මධ්‍ය මහා විද්‍යාලය (ජාතික පාසල) | 2025.04.30 දින පාසල් පැවැත්වීමෙන් පසු සිට 2025.05.07 දක්වා |
| | | වෙයන්ගොඩ පත්තලගෙදර සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය | 2025.04.30 දින අධ්‍යන වැඩකටයුතු පැවැත්වීමෙන් පසු සිට 2025.05.07 දක්වා |
| | | විද්‍යාලෝක මහා විද්‍යාලය, පත්තලගෙදර | 2025.04.30 දින පාසල් පැවැත්වීමෙන් පසු සිට 2025.05.07 දක්වා |
| 03 | කළුතර | තිස්ස මධ්‍ය මහා විද්‍යාලය - කළුතර උතුර | 2025.05.02 ප.ව.2.00 සිට 2025.05.06 දක්වා |
| | | ෆියුසියස් විද්‍යාලය - කළුතර උතුර | 2025.05.04 ප.ව.2.00 සිට 2025.05.06 දක්වා |
| | | වේලාපුර මහා විද්‍යාලය කළුතර උතුර | 2025.05.04 ප.ව.2.00 සිට 2025.05.06 දක්වා |
| 04 | මහනුවර | මහ/ශාන්ත සිල්වෙස්තර විද්‍යාලය - මහනුවර | 2025.05.03 සිට 2025.05.07 දක්වා |
| | | මහ/ශාන්ත් සිල්වෙස්තර විද්‍යාලය - ප්‍රාථමික අංශය - මහනුවර | 2025.05.03 සිට 2025.05.07 දක්වා |
| | | මහ/ ශ්‍රී සුමංගල විද්‍යාලය - මහනුවර | 2025.05.03 සිට 2025.05.07 දක්වා |
| 05 | මාතලේ | ක්‍රිස්තුදේව ජාතික පාසල - මාතලේ | 2025.05.03 සිට 2025.05.07 දක්වා |
| | | මා /පාක්‍යම් ජාතික පාසල - මාතලේ | 2025.05.03 සිට 2025.05.07 දක්වා |
| 06 | නුවරඑළිය | නු / ගාමිණි ජාතික පාසල - නුවරඑළිය | 2025.05.02 සිට 2025.05.07 දක්වා |
| 07 | ගාල්ල | ගා /සවුත්ලන්ඩ්ස් බාලිකා විද්‍යාලය - ගාල්ල | 2025.05.01 සිට 2025.05.07 දක්වා |
| 08 | මාතර | මාර / ශාන්ත සර්වේසස් විද්‍යාලය - මාතර | 2025.05.02 සිට 2025.05.07 දක්වා |
| | | මාර / මහාමායා බාලිකා විද්‍යාලය - මාතර | 2025.05.03 සිට 2025.05.07 දක්වා |
| 09 | යාපනය | යාපනය මධ්‍ය මහා විද්‍යාලය | 2025.05.02 සිට 2025.05.07 දක්වා |
| 10 | මඩකලපුව | මඩ/ හින්දු විද්‍යාලය - මඩකලපුව | 2025.05.02 සිට 2025.05.07 දක්වා |
| 11 | අම්පාර | හාඩි කාර්මික විද්‍යාලය - අම්පාර | 2025.05.01 සිට 2025.05.09 දක්වා |
| 12 | ත්‍රිකුණාමලය | ත්‍රි/ විපුලානන්ද විද්‍යාලය - ත්‍රිකුණාමලය | 2025.05.01 සිට 2025.05.07 දක්වා |
| 13 | කුරුණෑගල | මලියදේව පිරිමි විද්‍යාලය - කුරුණෑගල | 2025.05.03 සිට 2025.05.07 දක්වා |
| | | මලියදේව බාලිකා විද්‍යාලය - කුරුණෑගල | 2025.05.03 සිට 2025.05.07 දක්වා |
| | | ශ්‍රීමත් ජෝන් කොතලාවල විද්‍යාලය - කුරුණෑගල | 2025.05.03 සිට 2025.05.07 දක්වා |
| | | තාක්ෂණ විද්‍යාලය - කුරුණෑගල | 2025.05.03 සිට 2025.05.07 දක්වා |

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2025**

**පාසල්/ අධ්‍යාපන ආයතන වල ගොඩනැගිලි වෙන් කරවා ගැනීම**

| | | | |
|---|---|---|---|
| 14 | පුත්තලම | ශාන්ත ඇන්ඩෲ මධ්‍ය මහා විද්‍යාලය- පුත්තලම | 2025.05.01 සිට 2025.05.07 දක්වා |
| | | ආනන්ද ජාතික පාසල - පුත්තලම | 2025.05.03 සිට 2025.05.07 දක්වා |
| | | සහිරා ජාතික පාසල - පුත්තලම | 2025.05.03 සිට 2025.05.07 දක්වා |
| 15 | අනුරාධපුර | අ / මධ්‍ය විද්‍යාලය | 2025.05.03 සිට 2025.05.07 දක්වා |
| 16 | පොළොන්නරුව | පො/රාජකීය මධ්‍ය මහා විද්‍යාලය | 2025.05.02 සිට 2025.05.07 දක්වා |
| 17 | බදුල්ල | බ/බදුල්ල මධ්‍ය මහා විද්‍යාලය - බදුල්ල | 2025.05.01 සිට 2025.05.07 දක්වා |
| | | බ/ ධර්මදූත මහා විද්‍යාලය - බදුල්ල | 2025.05.01 සිට 2025.05.07 දක්වා |
| 18 | මොණරාගල | මො/රාජකීය ජාතික පාසල -මොණරාගල | 2025.04.30 ප.ව.2.00 සිට 2025.05.07 දක්වා |
| 19 | රත්නපුර | ර/කුමර විද්‍යාලය - රත්නපුර | 2025.05.01 සිට 2025.05.07 දක්වා |
| 20 | කෑගල්ල | කෑ/කෑගලු බාලිකා විද්‍යාලය -කෑගල්ල | 2025.05.01 සිට 2025.05.07 දක්වා |
| | | කෑ/ස්වර්ණජයන්ති මහා විද්‍යාලය | |